# නිර්මාණ Nirmana

## ගම අසරණය !

අවසන් ගමන කවදා හෝ උපන් ගමේ
සිදුවිය යුතුයි කිව් පිය බස ඇතිව පෙමේ
ලැබුමට සිතා සහයෝගය සැමගෙ ගමේ
අවුරුදු ගණනකට පසු මම ගියා ගමේ

ආදර පියා වැජඹුණ මහ පිරිස් මැද
තනිවම නිදයි අම්මාගේ කඳුළු මැද
අමතර පන්ති සේවා මුර අතර මැද
ලද පොඩි ඉඩෙන් නෑ මිතුරන් පැමිණි සඳ

තොරණක් බඳින්නට සැරසිළි කරන් නට
ජාතක කතා කියමින් රෑය ගෙවන් නට
වතගොත අසා නෑ මිතුදම් රකින් නට
ලැබුණේ නැහැ ඉඩක් ගමෙ කිසි කෙනෙක් හට

දුව පැන ඇවිද වෙල් එළිවල ඒ කාලේ
පන්සල පාසැලට අප හැම ගිය තාලේ
මගුල් තුලා වල එකමුතු වුණු ලීලේ
සිහිවී කඳුළු වැටුණා දෙකොපුල දෑලේ

කරලින් බරව රන්වන් වූ වෙල් යාය
ගුමු ගුමු නදින් රසවත් වූ මල් යාය
ලෙන්ගතුකමින් ඔපවත්වූ හැදි යාව
කොහි සැඟවුණිද අපෙ ගම්බද සිරි යාව

ගුණ දම් දැනුම ගම් පියසින් උරා ගෙන
උගතුන් ධනවතුන් වූ ඒ බොහෝ දෙන
ගම හැර ගියෙන් තම දියුණුව සොයා ගෙන
ගම අසරණව ඇත සෝබර විලා සෙන

♦ **කුමාරි විජේරත්න**
Hounslow **Middx UK**



## ගව මවක් මෙසේ කියයි

දරුවන් අඬන විට මගෙ කිරි ටික දෙනවා
මගෙ පොඩි පැටියා කුසගින්නේ ලත වෙනවා
සමහර විටක මම කිරි හංගලා දෙනවා
ඒ මුත් අපට සලකන හැටි හොඳ මදිවා

ගතවී ටික කලක් මම වයසට යනවා
මාගේ වටිනකම එතකොට අඩු වෙනවා
සමහරු පැමිණ මා මුදලට ඉල් ලනවා
මාගේ පෙර පවට මස් මඩුවට යනවා

තෙරුවන් පුදන බුදු දහමින් පිරුණු රට
පෝයට සිල් ගන්න දම්පද දෙසන රට
ගව ඝාතනය ඇයි දෝ බැරි නව තන්ට
ඔතරම් ඇයි ද? කෑදර ගව මස් කන්ට

කිරි ටික වෙඩරු ටික අපගෙන් අර ගන්නේ
මුත්‍රා ටිකත් ගෙන බෙහෙතට යොද වන්නේ
ඇට කටු ගොම ටිකත් පොහොරට මය ගන්නේ
හදවත නොමැති මිනිසුන්ම ද දැන් ඉන්නේ

දම්පල් තුමා සිටියා නම් කල් මෙතෙක
යනවා සහතිකයි අප හැර වෙන රටක
මේසා උතුම් මිනිසත් බව ලැබූ කලෙක
මේ වියැසනය නවතාලනු බැරි කිමෙක?

♦ **එස්. කංකානම්ගේ London SE5**

## කම්පනය

ඔබ හිනැහෙන සඳ ලොවම සිනාසෙයි
ඔබ හා එක්වී සිනා නගා
ඔබ වැළපෙන සඳ මුළු ලොව සැනසෙයි
වැළපෙන ඔබ නෙතු කඳුළු තියා

රන් දෙතොලක පිරිපුන් අම රාගය
අඳුන් ඉලූ නෙත් කොණ ඊර්ෂයාවය
පිළිසඳරෙහි සිත පැහැදී ගත්තේ
අන් සිත් තුළ ඔබ ගැන වූ වෛරය

විෂමව කැරකෙන ලොව දෙස බලමුද
ඇතින් ඇතට වී හිඳ දෙදෙනම
කලියුගයේ දෙදරුම්කන රාවය
ඔබ දුටුවෙද පිය සබඳ! දුටිමි මම !

♦ **කුමුදු රොහාන් අමරසිංහ**
**Edmonton, London**



## නාඩගම

රඟදැක්වේ එළිපිටම
සුභ සහ යස නාඩගම
කිසිදු අයකිරීමක් නැතිවම
සැපැති සිහසුන මත
සුභයෝ හිඳුවති බලෙන්
යසයෝ හිනැහෙති ඉල බදා
නාඩගම තුළ නාඩගම
නොදන්නා ප්‍රෙක්ෂක
තුෂ්නිම්භූතය, නැත සිනා.
ලොබවී සිහසුනට
සුභයෝ පොරබදති යස හා
රාජ පාක්ෂිකත්වය හැර දමා
තරඟයකි රැඟුම් අවසන
හඳුනාගන්නට රජ තෙම
නාටකය තව නැත නිමා
මහා කලබැගෑනිය තුළ
කළකිරුණු ප්‍රෙක්ෂක තොමෝ
විසිර යති තිරය වැහෙන්නට ද පෙර

♦ **ශ්‍රියා කුමාරසිංහ**
**Dunedin - New Zealand**

## නික්ම යමි



හික්මවා සිත මනා විනයෙන්
ළඟට නැවිත් දුරින් උන්නෙමි
රිදෙන බව දැන ඔබේ සිතුවිලි
යා යුතුම වුව නොයා උන්නෙමි

ගිලිහෙනා විට ප්‍රේමයේ හඬ
ගොලුව බිහිරිව ළඟ ම උන්නෙමි
ඉකිගහන දුක වියැළි කඳුළින්
තෙත් ඇසෙහි සඟවාන උන්නෙමි

තරුදහක් මැද වුනත් සඳහට
සුවඳ රැකගෙන මම හිඳින්නෙමි
අඳුර විතරක් සිතින් අරගෙන
සඳ නගරයෙන් නික්ම යන්නෙමි

♦ **නිලූෂිකා නේරංජනා ජයසූරිය**
**Sri Lanka**

## බෝවිටියා මල්

පින්නේ පිපුණු මල් සේරම බිම තාම
දෙවටේ පාර පාළුයි උඹ නැතු වාම
හොඳටම දුක හිතී නොකියා ගිය දාම
ඇට්ටේරියා මල් ඇඩුවා හොඳ ටෝම

අප්පච්චී එදා උරණව තැලූ වාම
ලොවට හොරා නුඹ ඉකිබින්දලූ බෝම
ඉක්මන් වුණේ ඒකද වෙනතක යාම
මේ හේනේ පැලේ මම තනියම තාම

මේ බඩවැටිය නුඹගේ සුවඳයි තාම
බෝවිටියා පිපේ තාමත් පෙර සේම
ඈතක දුරක වෙන්වී සිටියත් මේම
අපි ආදරෙයි අපි දෙන්නට හැම දාම

♦ **දඹේගොඩ ජිනදාස** **Sri Lanka**

## සැබෑව

අසන්නේ කුමක්ද - ඇසෙන්නේ එයයි
බලන්නේ කුමක්ද - බැලෙන්නේ එයයි
දරන්නේ කුමක්ද - දැනෙන්නේ එයයි
සිතන්නේ කුමක්ද - කෙරෙන්නේ එයයි

ඇසෙන විට පෙනෙන විට
හොඳම දේ හොඳ ලෙසට
සැහැල්ලුව සුව සහන
පුබුදුවයි ගත සිතට
ලොවට ගැලපෙනා දේ
සිතන විට නිති තුටින
කෙරෙති නිති හොඳ දේම
ලොවට යහපත් ලෙසින

♦ **ප්‍රදීපා වික්‍රමසිංහ**
**Wimbledon - London SW19**

## මගේ සඳ

පබැඳූ කව් දස දහසක
සෙනෙහස් සුවඳයි දැනුණේ
ඒ හැම කවි සිතුවිල්ලක
නොනිමි මිහිරි රුව නුඹවේ

කලා සොළොස පිරි සඳ සේ
නුඹ හිනැහෙන සඳ ගුවනේ
වාවා ගනිම්ද කෙලෙසේ
හදවත සිතුමන් සසැළේ

පින්සර නුඹ නෙතුමානේ
රන්දම විලසින් බැඳුණේ
පෙම් කව නුඹමය මහදේ
වෙන්වන තුරු සංසාරේ

♦ **ධම්මි විජේසිංහ**
**Toronto - Canada**

## අතීත කතා

වර්ෂ 1945 පමණ කාලයේ බෝයගම කිවියර නම් කවි කීමට හා පබැඳුමට දක්ෂ භික්ෂූන් වහන්සේ නමක් වැලිසර පැත්තේ පන්සලක වැඩ වාසයකර සිටි බව කියති. ඒ කාලයේ ගම්වල ජනතාවට රට තොට ආරංචි ලබාගැනී මට පහසුකම් කිසිවක් තිබුණේ නැත. මේ ස්වාමීන් වහන්සේ පන්සලේ තාප්පයේ කලු ලෑල්ලක් එල්ලා ඒ පළාතේ සිදුවන කිසියම් සිද්ධියක් වෙතොත් එය කවියට නගා අර කලුලෑල්ලේ ලියා තැබීම සිරිතක් වශයෙන් කරගෙන ගොස් තිබේ. මෙය දන්නා ගම්වැසියෝ ද බොහෝ සංතෝෂයෙන් නවතම ප්‍රවෘත්ති කියවන්නට පන්සල් තාප්පය ළඟට යති. එක් දිනක් එහි ලියා තිබූ කවියක් මෙසේය.

පාගා හැටට හැට
වැලිසර කන්දනෑගු මට
ගිය රථය ගහ කට
හැපී මිනිසුන් ගියා මරණෙට

තවත් දවසක ලියා තිබුණු කවියක් මෙසේ ය.

නොවැද ළඟ පන් සල
සමහරු දුවති සල් ගල
මොවුන්ගේ පුස් මොළ
වලට අල්ලනු අභුරු දුම් මල

තවත් දවසක ස්වාමීන් වහන්සේලා පිරිසක් පන්සල ළඟ තිබුණු ගෙදරක මියගිය පියාගේ තුන්මාසේ දානයට එහි වැඩියහ. ස්වාමීන් වහන්සේලා වඩා හිඳුවා මොහොතකින් දානේ බෙදීම කෙසේ වෙතත් පියාගේ දේපළ ගැන ඇතිවූ කතාබහක් දුරදිග ගොස් ඒ ගේ ඇතුළේ ගුටි කෙළියක් ඇසෙන්නට වීය.

පහුවදා උදයේ පන්සලේ බෝඩ් එකේ මේ කවිය තිබුණි.

පන්සලෙන් ගෙන්නා
උන් දානයක් දුන්නා
ගෙදර ගහ ගන්නා
අතරමහණුන් දොරට පැන්නා!

මේ කවිය ගැන ආරංචිය ලැබී ඒ ගෙදර චන්ඩි පුතෙක් පන්සල ළඟට ඇවිත් හාමුදුරුවන්ට දෙස් තබන්නට පටන්ගෙන ඇත. අසල්වැසි මිනිස්සු ඔහුට බැණ හූ කියා එළවා දැමූහ.

♦ **ප්‍රේමා එස්. රූපසිංහ**
**උඩහමුල්ල - නුගේගොඩ**
**Sri Lanka**

## අහිමි පෙම

සීතල සුළඟ දුක් ගීයක් මුමුණන වා
පාළුව තනිය අසරණ බව ගෙන දෙන වා
සිත රැඳි පැතුම් ගංගා වියැළී යන වා
සුදු මල් දෙකැකුළක් ඉකිබිඳ වැළපෙන වා

මවකගෙ නෙතක කඳුලක් නැංවෙන්න නොදී
පිය මුදු හිතක රුදු ගති තැවරෙන්න නොදී
ධන බල මිළ මුදල් ආශා සිතුම් පොදී
මහ බැමි මැදින් දෙමහක යමු සිතින් බැඳී

බන්දා අදර රන් වියමන් සිනා සෙමින්
ආ මුත් සසර මග නුඹ මා බැඳුණු පෙමින්
දිවියේ නොනිමි බැමි මුසු කම්කටොළු නමින්
වෙන් කළ නොහැක මුදු සෙනෙහස ඉවත ලමින්

දුක් වේදනා අගහිඟකම් තිබුණා ට
ජීවිත වල අගය හිඟවී පෙනුණා ට
දුටු නෙතු බඳින ධන බල මුළු නැතුවා ට
සිත රැඳි සුදු ගතිය සුවඳකි සැමදා ට

සෙනෙහස ගීතයක් මදසර නදින් ඇසේ
සෝ දුක් කම්කටොළු අප පසුකරනු දිසේ
දිවියේ අතරමඟ වෙන්වී ගියද මෙසේ
දෙහදක හැඟුම් නවතාලනු හැකිද කෙසේ

මා දිවි සෙවන කළ මහ නුගරුකක සෙනේ
හෙට දින අහිමි වී යන සැටි සිතට දැනේ
නුඹගේ සිහිල ඇතිරූ පෙර දිනක මෙනේ
සුළඟක් වෙලා මා හිස පිරිමදිනු මැනේ!

♦ **දුලාංජලී සිරිවර්ධන**
**පානදුර Sri Lanka**

## මගේ සැත්කම

පපුවේ සැදුණ සුළු රිදුමක් නිසා මට
සිදුවුණි මිඩ්ල්සෙක්ස් රෝහල වෙත යන්ට
චිත්‍රා ප්‍රභා පැමිණිලා මා සහා යට
මා ගෙන ගියා විගසට පිළියම් ගන්ට

නිම කෙරුණාය සායනයද එකම දිනෙන්
චිත්‍රා සිටියාය නොසැලී මගේ ළඟින්
මා අස්වසා සනසා දියණියක් ලෙසින්
පිළිකාවක් කියා ඒ හැම සිටියෙ බියෙන්

සිටියා එතැන තව අය මා වගෙ රෝගින්
එහි ඒ සැමට සලකන්නේ එකම ලෙසින්
හෙද හෙදි සැවොම ඉහළින් උවටැන් කරමින්
සලසන සහන අගයනු යුතු වෙයි ඉහළින්

මෙත් කරුණා ගුණය පුරවා ගත් හදෙහී
හෙද හෙදි පිරිස් සහ වෛදවරු රෝහලෙ හී
ඉටු කළ බැවින් කාරිය සැම ඇතිව සිහී
මැනවින් නිමාවුණි සැත්කම එම දිනෙහී

සති කීපෙකින් ලැබුණා වූ පණිවුඩයෙ න්
රෝහළ වෙත ගියෙමි මා දියණිය සමගි න්
පිළිකාවක් නොවේ එය පැවසූ පුවති න්
සැනසෙන්නට වීමි පෙර කළ පිනක් බැවි න්

♦ **රත්නාවලි කුමාරි දිසානායක**
**Hounslow, Middx, UK**

## කුරුළු ගීතය

රුක්මල් සුවඳට බඹරුන් කැන්දන රුක්මලියේ
සපුමල් සුවඳට බිඟුන් බමනවා සපු මලියේ
සීතල සුළඟට මලු පූදිනවා බණ්ඩි ගොයම්වල හිමිදිරියේ
මගෙ හිතගාවට සුවඳක් ඇවිදින් ඈතට යනවා මං තනියේ

ගිරා මලිත්තන් කිච් බිච් ගානා බෝවිටියා මා දං පඳුරේ
මල් සූටික්කන් කූඩු තනනවා හැඩවැඩ තියලා ලහි ලහියේ
නීල කොබෙයියන් නිල් පිළිහුඩුවන්
තාලෙට රඟනා පුලින තලේ
උන්ගේ පැටවුන් දොරට වඩිනවා
මල් මංගල්ලේ සුබ නැකතේ

♦ **වසන්තා කුමාරි දසනායක - කිරිඳිවැල**

## Up In The Sky

**by Amanda Jenkins**

When you are down
And you want to get high,
Just take a good look
Up in the sky.

What you will see
Are the stars above,
And all you need
Is to proclaim your love.

Who you will find
And see so clear,
Are friends in mind
You want to hold near.

Whenever you need them
Just look up high,
Call their name
And see them fly.

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

Every friend you meet
Owns a star
And you can see them
No matter how far.

Whenever you are down
And want to get high,
Just take a good look
Up in the sky.